**ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් - 2017**

**-----------------------------------------------**

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් ප්‍රතිපත්ති 2.3.7 අනුව වත්කම්වල අපහරණ අගය , ඵලදායි ජීව කාලය සහ ක්ෂය ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ඒ අනුව අදාල ගැලපුම් සිදු කරන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.42,731,605 ක් වූ සමාගමේ වත්කම් සමාලෝචනය කර අවශ්‍ය ගැලපුම් සිදු කර නොතිබුණි.

**2.2.2** **නොසැසඳුනු ගිණුම්**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට වරාය අධිකාරියෙන් අයවිය යුතු කළමනාකරණ සේවා ගාස්තු රු. 25,458,072 ක් වූ අතර වරාය අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමට ගෙවිය යුතු ශේෂය ලෙස රු. 24,913,388 ක් දක්වා තිබුණි. මේ අනුව එම ගිණුම් ශේෂ අතර රු. 544,684 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3** **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි සැලසුමක් සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අය කර ගත යුතු වූ රු. 5,779,760 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, එම මුදල වරාය අධිකාරියේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ශේෂයක් ලෙස ඇතුලත් වී නොතිබුණි. කෙසේ වුවද මෙම මුදල අයකර ගැනීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 3,502,963 ක් වූ ආදායම් බදු මුදලින් රු. 2,092,290 ක් 2017 වර්ෂයේදී ගෙවා තිබුණු නමුත් ඉතිරි මුදල වූ රු. 1,410,673 ක් 2018 මාර්තු 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වෙනුවෙන් වර්ෂයක් සඳහා රු.200,000 ක දීමනාවක් හිමි බවත් මෙම වටිනාකමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට සහභාගිවීම වෙනුවෙන් රු.15,000 ක් බැගින් ගෙවීමටත් වර්ෂය අවසානයේ ලබා නොගත් ඉතිරි මුදල අදාල නිලධාරියාට ලබා ගැනීම සඳහාත් 2016 ජනවාරි 12 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන තිබුණි. අංක පීඊඩී 3/2015 දරන 2015 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනි වූ මෙම රු. 200,000 දීමනාව සඳහා මහා භාණ්ඩාගාරය අනුමැතිය ලබා ගැනීමට 2017 අප්‍රේල් 18 දිනැති අංක MPS/AD/6/68/2017 දරන ලිපිය මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර තිබුණද 2018 මාර්තු 31 දින තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

තවද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට සහභාගිවීම වෙනුවෙන් එක් සාමාජිකයෙකු සඳහා ප්‍රවාහන ගාස්තු ලෙස රු. 10,000 බැගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක දී රු. 520,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවා තිබුණි. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබූ නමුත් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව සමාගමේ එක් එක් අංශයෙහි කාර්යසාධනය සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකර නොතිබුණි. |
| (ii) 5.1.1 වගන්තිය | සමාගම විසින් සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කර නොතිබුණි. |
| (iii) 7.2 වගන්තිය | ආයතනයේ පාලන පරිසරයේ ප්‍රධාන අංගයක් ලෙස සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System) පිළියෙල කළ යුතු වුවත් සමාගම එවැනි මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. |
| (iv) 7.4.5 වගන්තිය | 2017 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.42,731,605 ක් වූ ස්ථාවර වත්කම් සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. |

(v) 9.3.1 වගන්තිය

සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින් සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) සකසා ඊට රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගත යුතු වුවත්, සමාගම පවතින තනතුරු සඳහා චක්‍රලේඛ ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඊට අදාල පාර්ශවයන්ගේ අනුමැතීන් ලබාගෙන නොතිබුණි. සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට 94 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි.

(vi) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපි

- 2017 මාර්තු 21 දිනැති අංක PE/PS/JCTL/2017 දරන ලිපිය

සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට රු.330,038,900 ක සමුච්චිත ලාභයෙන් සියයට 10 ක් වන රු.33,003,890 ක මුදලක් හා 2016 වර්ෂයේ රු.77,651,525 ක ශුද්ධ ලාභයෙන් සියයට 30 ක් වන රු.23,295,457 ක් ලාභාංශ ලෙස 2017 ජුලි 31 දිනට මව් ආයතනය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස දන්වා තිබුණ ද මෙම වාර්තාවේ දින වන විටත් අදාල මුදල් මහා භාණ්ඩාගාරය වෙත ලබා දී නොතිබුණි. එසේම මෙම ගෙවිය යුතු මුදල 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ලාභාංශයක් ලෙස ද හඳුනාගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දෑ රු.56,299,347කින් ඌන ගණනය වී තිබුණි.

- 2018 අප්‍රේල් 24 දිනැති අංක PE/PS/JCTL/GEN/2018 දරන ලිපිය

සමාගම විසින් ලාභාංශ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු වන බවටත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඔවුන්ගේ ආදායමින් කොටසක් ලෙස එම ආදායම් මහාභාණ්ඩාගාරයට ගෙවිය යුතු බවටත් උපදෙස් ලබා දී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 104.7 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 77.6 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 27.1 ක එනම් සියයට 35 ක වර්ධනයක් නිරීක්ෂණය විය. දල ලාභය රු.මිලියන 26 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. එම ලාභය වැඩිවීම සඳහා තෙල් මෙහෙයුම් කටයුතු වල වර්ධනය වීම හා ඩොලරයට සාපේක්ෂව රුපියල් වටිනාකම වැඩි වීම (විනිමය අවප්‍රමාණය වීම ) හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ රු.මිලියන 45ක් ව පැවති ලාභය ඉන් පසු වර්ෂවලදී උච්ඡාවචනය වී තිබුණු අතර 2017 වර්ෂය අවසානය වන විට එම අගය රු.මිලියන104 ක් විය. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.මිලියන 159 ක් ව පැවති සමාගමේ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂය අවසන් වන විට රු.මිලියන 237 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් ප්‍රධාන තෙල් වර්ග 03ක් සඳහා ගබඩා පහසුකම් සැපයීම , උණුසුම් කිරීම හා පරිවහන පහසුකම් සැපයීම සිදු කරයි. එම සේවා මත තෙල් පරිවහන ගාස්තු, ගබඩා කිරීමේ ගාස්තු හා එම්එෆ්ඕ (MFO) 380 වර්ගයේ තෙල් සඳහා උණුසුම් කිරීමේ ගාස්තු ලෙස ප්‍රධාන ගාස්තු වර්ග 3ක් අය කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුල ගාස්තු ලෙස පිළිවෙලින් රු.මිලියන 255 ක්, රු.මිලියන 183ක් හා රු.මිලියන 100 ක් වශයෙන් එකතුව රු.මිලියන 538ක ආදායම ද අතිකාල ගාස්තු ආදායම් හා අනෙකුත් ගාස්තු ලෙස රු.මිලියන 10ක් ලෙස මුළු එකතුව රු.මිලියන 548ක් ආදායම් ලෙස රැස් කර තිබූ අතර එයින් සියයට 55 ක් හෙවත් රු.මිලියන 301ක් වරාය අධිකාරියේ කොටස වූ අතර සියයට 45 ක් හෙවත් රු.මිලියන 247ක් සමාගමේ ආදායම් ලෙස රඳවාගෙන තිබුණි.

(ආ) පෙර වර්ෂයේ රු.මිලියන 203ක් වූ මුළු ආදායම සමඟ සැසඳීමේ දී ප්‍රවර්තන වර්ෂය තුල සමාගමට ලැබුණු ආදායම රු.මිලියන 43 කින් හෙවත් සියයට 21.13 කින් වර්ධනය වී තිබූ අතර ඒ සඳහා තෙල් මෙහෙයුම් කටයුතු සියයට 20.68 ක වර්ධනය වී තිබීම මෙන්ම විනිමය අනුපාතිකයේ ඉහලයාම ද බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය වනුයේ වර්ග තුනකට අයත් නැව් තෙල් පැටවීම හා ගොඩබෑම වන අතර ඊට අදාලව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ තුනක තොරතුරු පහත පරිදි විය.

<u>ඒකක මෙට්‍රික් ටොන්</u>

| තෙල් වර්ගය | 2017 | | 2016 | | 2015 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|
| | පැටවීම් | ගොඩබෑම් | පැටවීම් | ගොඩබෑම් | පැටවීම් | ගොඩබෑම් | පැටවීම් | ගොඩබෑම් |
| MFO 180 | 25,591 | 23,627 | 26,610 | 26,513 | 38,172 | 36,377 | 46,083 | 48,131 |
| MFO 380 | 481,239 | 506,773 | 378,300 | 386,345 | 347,143 | 338,750 | 226,153 | 243,460 |
| M.GAS OIL | 52,007 | 45,802 | 56,522 | 57,523 | 50,714 | 50,274 | 61,402 | 61,997 |
| **එකතුව** | **558,837** | **576,202** | **461,432** | **470,381** | **436,029** | **425,401** | **333,638** | **353,588** |
| වර්ධනය ඒකක | 95,441 | 82,194 | 25,403 | 44,980 | 102,391 | 71,813 | -- | -- |
| වාර්ෂික වර්ධන ප්‍රතිශතය | 21 | 17 | 6 | 11 | 31 | 20 | -- | -- |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම්එෆ්ඕ (MFO) 380 වර්ගයේ තෙල් පැටවුම් (Loading) සියයට 27 කින් වැඩි වී තිබූ අතර නාවික ගෑස් තෙල් (Marine Gas Oil) හා එම්එෆ්ඕ (MFO)180 තෙල් වර්ග පිළිවෙලින් සියයට 8 කින් හා සියයට 4 කින් අඩු වී තිබුණි. සමස්ථ තෙල් පැටවුම්වලින් සියයට 87 ක් නියෝජනය කරන එම්එෆ්ඕ (MFO) 380 තෙල් පැටවීම් වර්ධනය වී තිබීම හේතුවෙන් සමස්ථ පැටවීම් සියයට 20 කින් වර්ධනය වී තිබුණි.

(ආ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී එම්එෆ්ඕ (MFO) 380 වර්ගයේ තෙල් ගොඩබෑම් (Discharging) සියයට 31 කින් වැඩි වී තිබූ අතර නාවික ගෑස් තෙල් (Marine Gas Oil) හා එම්එෆ්ඕ (MFO) 180 වර්ගයේ තෙල් ගොඩබෑම් පිළිවෙලින් සියයට 20 කින් හා සියයට 11 කින් අඩු වී තිබුණි. සමස්ථ තෙල් ගොඩබෑම්වලින් සියයට 86 ක් නියෝජනය කරන එම්එෆ්ඕ (MFO) 380 වර්ගයේ තෙල්වල ගොඩබෑම් කටයුතු වර්ධනය වී තිබීම හේතුවෙන් සමස්ථ ගොඩබෑම් සියයට 18 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) සමාගම සතුව මුළු ධාරිතාව මෙට්‍රික් ටොන් 35,988 ක් වූ ටැංකි 13 ක් පැවති අතර ඒවායින් ටැංකි 06 ක් හෙවත් මුළු ධාරිතාවෙන් සියයට 58.51 ක් එම්එෆ්ඕ වර්ගයේ (MFO) 380 ද, තෙල් ටැංකි 06 ක් හෙවත් මුළු ධාරිතාවෙන් සියයට 26.4 ක් එම්ජීඕ (MGO) වර්ගයේ තෙල් ද අනෙක් ටැංකිය තුළ මුළු ධාරිතාවෙන් සියයට 15 ක් එම්එෆ්ඕ (MFO) 180 වර්ගයේ තෙල් ද ගබඩාකර තිබුණි.

(ඇ) එක් එක් වර්ෂය තුල තෙල් සඳහා අයකර තිබූ ගබඩා ගාස්තු (Storage Charges) අනුව සැලකූ විට සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 4 ක් තුල තෙල් වර්ග 03 සඳහා මුළු ටැංකි ධාරිතා උපයෝජනය කර තිබූ ආකාරය පහත පරිදි විය.

| **වර්ෂය** | **2017** | **2016** | **2015** | **2014** | **2013** |
|---|---|---|---|---|---|
| උපයෝජන අනුපාතය(සියයට) | 61.03 | 57.77 | 47.59 | 51.53 | 34.22 |

ඉහත දත්ත අනුව 2013 දී සියයට 34 ක් වූ ධාරිතා උපයෝජනය ක්‍රමයෙන් වැඩි වී 2017 වර්ෂය වන විට සියයට 61 දක්වා වැඩි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම සතු තෙල් ටැංකි 13 තුල නියෝජිතයන් 11 දෙනෙකු සතු තෙල් වර්ග 3ක් ගබඩා කරන අතර එහිදී නියෝජිතයින් විසින් ටැංකි පොදුවේ භාවිතා කරයි. ටැංකි තුලට පොම්ප කරන තෙල් ප්‍රමාණය හා ඉවත් කරන තෙල් ප්‍රමාණය නිමානය කිරීම නිවැරදිව සිදු නොකිරීම හේතුවෙන් 2014, 2015, 2016 හා 2017 වර්ෂයන් තුල පොත් ශේෂයන් හා භෞතික ශේෂයන් අතර වූ වෙනස්කම් ලෙස තෙල් මෙට්‍රික් ටොන් 2,576 ක් වූ තෙල් තොගයක් ශ්‍රී ලංකා රේගුව විසින් අවස්ථා 4ක දී රාජසන්තක කර තිබුණි. එම තෙල් තොගය රේගුව විසින් විකිණීමේදී ඉහත නියෝජිතයන් විසින්ම මිලට ගෙන නැව්වලට නිකුත් කර තිබුණි. මෙම තෙල් තොග ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කර නැවත විකුණන තෙක් ඒ සඳහා ගබඩා ගාස්තු අය කිරීමක් සිදු නොවේ. කෙසේ වුවද, වඩා කාර්යක්ෂම තෙල් තොග පාලන ක්‍රම හඳුන්වාදීම මඟින් සමාගමට ගබඩා ගාස්තු ලෙස වැඩි පුර ආදායමක් ලබා ගත හැකි බව නිරීක්ෂණය විය.

(ආ) නිලධාරින්ගේ තනතුරු නාමය භාවිතා කිරීමකින් තොරව පෞද්ගලික නම් වලින් සමාගමේ කොටස් පැවරුම් සහතික නිකුත් කිරීම හේතුවෙන් අදාල තනතුරු දරන නිලධාරීන් විශ්‍රාම සහ ඉවත්ව යන විටදී විධිමත් ලෙස පැවරීම සිදු නොකල අවස්ථා නිරීක්ෂණය විය. මේ හේතුවෙන් කොටස් පැවරීමේ කටයුතුවල යාවත්කාලීන හා වලංගු බව පිළිබඳ නීතිමය ගැටළු ඇති වීමේ අවධානම බැහැර කල නොහැකි විය.

(ඇ) ගබඩාවට භාණ්ඩ ලැබීමේදී භාණ්ඩ ලැබීම් පත්‍රිකා (GOOD RECEIVEING NOTES) නිකුත් කළ යුතු අතර ලද භාණ්ඩ පිළිබඳ වාර්තා අදාල බින් කාඩ් (BIN Card) වල සටහන් කල යුතු වේ. එහෙත් සමාගම විසින් 2017 වර්ෂය තුල මිලදී ගන්නා ලද රු. 1,632,445 ක් වූ භාණ්ඩ ලැබීම් වාර්තා කිරීම සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍රිකා සහ බින් කාඩ් පත් භාවිතා කර නොතිබුණි. එසේම වර්ෂය අවසානයේදි ඉතිරි තොග පිළිබඳ සමීක්ෂණයන් සිදු කර ඊට අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල වාර්තා කර නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

සමාගමේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වෙත නිශ්චිත වු කාර්ය පැවරීමක් සිදු කල යුතු වුවද සමාගම විසින් එහි සේවයේ නියුතු නිලධාරින් 94 දෙනාගෙන් 61 දෙනෙකුට රාජකාරී පැවරීමේ ලිපි (Duty List) ලබාදී නොතිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

--------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබු අතර 2017 දෙසැම්බර් 15 දින අභ්‍යන්තර විගණන නිළධාරියෙක් බඳවාගෙන අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීමට කටයුතු කර ඇති බව සභාපති විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සේවක මණ්ඩල කළමනාකරණය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | වාහන උපයෝජනය | එක් එක් වාහනය වෙනුවෙන් වාහන ලොග් සටහන් පොත් භාවිතා නොකිරීම. |